## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන

# පුරප්පාඩු

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින දිවයිනේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ජාතික අවශ්‍යතා මත පදනම්ව මූලිකව ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති සහ කර්මාන්ත සඳහා සේවා සැපයීම සිදුකරනු ලැබේ.

අප මධ්‍යස්ථානයේ පුරප්පාඩුව පවතින රසායනාගාර සහායක (PL-2) තනතුර සඳහා මාස 06 ක කාලයකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

## රසායනාගාර සහායක තනතුර (කොන්ත්‍රාත්)

**අධ්‍යාපන සුදුසුකම් :-**

- විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය එකවර සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම් :-**

- තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමට (NVQ Level 2) නොඅඩු සහතිකයක් ලබා තිබීම.

**විශේෂ නිපුණතා :-**

- මූලික පරිගණක සාක්ෂරතාවය (MS Word සහ MS Excel) තිබීම.
- රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ කාර්යාල සහායක කටයුතුවල නියැලීමේ පළපුරුද්ද තිබීම.

**රාජකාරී සහ වගකීම් :-**

- රසායනාගාර ලිපිගොනු, පරීක්ෂණ වාර්තා සහ බැටරි ආශ්‍රිත ලියකියවිලි පවත්වාගෙන යාම
- බැටරි සාම්පල, පරීක්ෂණ ප්‍රතිඵල වල දත්ත පරිගණකගත කිරීම.
- නියැදි ලබා ගැනීම, පරීක්ෂණ ප්‍රගතිය සහ බැටරි ඒකක පිළිබඳ වාර්තා පවත්වා ගැනීම.
- ලේඛණ සකස් කිරීම සහ ගොනු කිරීම සඳහා සහාය වීම.
- පරීක්ෂණ ලියකියවිලි සම්බන්ධයෙන් ඉංජිනේරුවරුන්ට සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයට සහාය වීම.
- ඡායා පිටපත් කිරීම, ස්කෑන් කිරීම සහ මුද්‍රණ කටයුතු සඳහා සහාය වීම.
- රසායනාගාර මෙහෙයුම් සඳහා කාර්යාල සහාය ලබාදීම.

වැටුප :- රු. 40,008/- (ක. සේ. ච. 01/2025 අනුව). මීට අමතරව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ගෙවනු ලැබේ.

වයස :- වයස අවුරුදු 18 – 45 අතර විය යුතුය.

**අනෙකුත් ප්‍රතිලාභ :-**

- සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% ක ආයතනයේ දායකත්වය සහ 10% ක සේවකයාගේ දායකත්වය.
- සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා 3% ක ආයතනයේ දායකත්වය.
- සේවා අවශ්‍යතාවය අනුව අමතර වැඩ කිරීම වෙනුවෙන් අතිකාල දීමනා ගෙවනු ලැබේ.

**අයදුම්පත් යොමු කිරීම :-**

ඔබගේ විස්තරාත්මක ජීව දත්ත සටහනක් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ සම්බන්ධකර ගත හැකි විස්තරද සමඟ (නම්, ලිපිනයන්, දුරකථන අංක ද ඇතුළුව) අදාළ සහතික පිටපත්ද සමඟ **2026.07.10 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන්** අධ්‍යක්ෂ ජනරාල්, නර්ඩ් මධ්‍යස්ථානය, කාර්මික ජනපදය, ඒකල, ජා ඇල වෙත යොමුකළ යුතුය. නැතහොත් ආයතනයට ගෙනැවිත් බාරදිය හැකිය. අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ කොටසේ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

දු.ක. : 0112 236 284, 0112 236 384, 0112 236 307
වෙබ් පිටුව : www.nerdc.lk